# ශ්‍රී ලාංකීය දේශීය ඥාණය හා ජෛව විවිධත්වය

**එස්. මැදවැව**
අධ්‍යක්ෂ - (වන සහ පරිසර)
වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය

කිසියම් ජාතියක් සතු දැනුම් සම්භාරය මැන ගතහැකි එක් සාධකයක් වන්නේ එම ජාතිය සතු සංස්කෘතිය හා කලා ශිල්පයන්ය. මෙම දැනුම් සම්භාරය බොහෝ විට එම ජාතිය විසින් බිහි කරන ලද ගද්‍ය හා පද්‍ය සාහිත්‍යය, ජනකලා, නැටුම්, ගැයුම් චාරිත්‍ර වාරිත්‍ර හා ඇදහිලි මගින් ප්‍රකාශනයට පත්වේ. ජීවය වූකලී පාරිශුද්ධය. එසේම එය සෑම මොහොතකම වෙනස්වීම ස්වභාව කොටගත් අඛණ්ඩ වූ විශ්වමය ක්‍රියා දාමයකි. බෞද්ධ දර්ශනය අනුව මෙම වෙනස්වීමේ ස්වභාවය සෑම ජීවියෙකුම භවයක් භවයක් පාසා ගමන් කරවන සංසාරයේ මූලික ගති ලක්ෂණයයි. වසර දෙදහසකට අධික කාලයක් තිස්සේ ශ්‍රී ලාංකීය දේශීය ඥාණය හැඩගසනු ලැබුයේ මෙම දර්ශණය මගිනි. අන් සියළු දේම එදා පවතිනුයේ මෙම පදනම මතය.

කිසියම් රටක දේශීය භාවය ප්‍රමාණාත්මක වශයෙන් ද, ඒ දෙස බලන ආකාරයෙන් ද කලින් කලට වෙනස් වන්නකි. බුදු දහම මෙරටට පැමිණි කාලයේ මෙරට දේශීය ඥාණය ගස්වැල්, ජලය, අන්ධකාරය, ආලෝකය, ඉර හා හඳ වැනි ස්වභාව ධර්මයේ වස්තූන්ට සීමා විය. බුදු දහමේ බලපෑම නිසා මෙම විශ්වාසයන් වඩාත් සරලවූද, එහෙත් දාර්ශනිකවූ ද, චින්තනයක් බවට පරිවර්තනය විය. පසු කාලයේ දී දේශීය ඥාණය යනු අනෙකක් නොව සරල බව, කරුණාව, මෛත්‍රිය හා ඉවසීම වැනි බෞද්ධ සිතුම් පැතුම් බවට පත්විය. මෙලෙසින් දේශීය භාවය කාලානුක්‍රමිකව වෙනස්වෙමින් පැවතුන අතර අද දේශීයත්වය යන්නෙන් අදහස් කරනුයේ දෙදහස් වසරකට පෙර පැවති තත්ත්වයට වඩා හාත්පසින් වෙනස් වූ ස්වභාවයකි. දේශීයත්වය පිළිබඳව සොයන්නෙකු අද නිතරම පෙළඹෙනුයේ නූතන විද්‍යාවේ බලපෑමට හසු නොවූ දෑ පමණක් දේශීය ලක්ෂණ ලෙස දැකීමටය. එහෙත් කිසිදු සංස්කෘතියක් බාහිර බලපෑම්වලින් මිදුනේ නොවේ. මුළු ඉතිහාසය පුරාම දේශීය ඥාණයේ පරිනාමය දෙස බලනවිට පෙනී යනුයේ එය වෙනස්වීම් රාශියක පෙළ ගැස්මක් වූ බවය. මෙරට ඉතිහාසය හැඩගස්වනු ලැබුයේ ද මෙම ස්වභාවයට අනුවමය. මෙරට සිදු වූ වෙනස්වීම් ඇතැම් විට යාබද ඉන්දීය අර්ධද්වීපයේ සිදුවූ වෙනස්වීම්වලටත් වඩා බැරෑරුම් ස්වභාවයක් දැරූ බව පෙනී යයි.

ඇතැම් සම්ප්‍රදායානුකූල සිරිත් විරිත් යම් යම් පුද්ගලයින්ට ආරෝපණය කිරීමේ සිරිතක් කලින් කළ පැවතින. මෙරට වැදි සමාජය සතු දැනුම එවැනි ආරෝපණයකට භාජනය වූවකි. පරම්පරානුගතව ඔවුන්ගේ ගති පැවතුම්, චාම් සිරිත් විරිත්වලට හා විශ්වාසයන්ට සීමා විය. වැදි සමාජ නිරන්තරයෙන් එක් නායකයකු පිළිබඳ විශ්වාසය තැබූ ජන සමාජයකි. එක් නායකයෙකු ජීවත්ව සිටින තාක් කල් ඔවුන් අනුගමනය කළ සිරිත් විරිත්වල අයිතිකරුද, ප්‍රධානියා ද විග්‍රාහකයා වූයේ ද එම නායකයාය. එම සමාජයේ සෙසු සාමාජිකයනට තම නායකයා සිතන ආකාරයට වෙනස්ව හෝ පටහැනිව හෝ ඉන් ඔබ්බට හෝ කල්පනා කිරීමට ඉඩක් නොලැබුණි. එවැනි උත්සාහයක් කිසියම් සාමාජිකයෙකු විසින් දරනු ලැබුයේ ද ඔහුට තවදුරටත් ජීවත්වීමට ඉඩ නොලැබුණි. වනයේ ජීවත්වූ මෙම ජන කොට්ඨශයේ ඥානය පෝෂණය වුයේ ඔවුන් අවට අසන්නට හා දකින්නට ලැබුණු ගස්වැල්, සතුන් සිවුපාවුන්, ඇතුළු විවිධාකාර වස්තූන්ගෙන්ය. ඔවුන්ට ලැබුණු දැනුමට අමතරව අත් දැකීම් සමුදායක් තිබුණි. මේ සියල්ලම ඔවුන්ගේ ජීවිකාව, සිරිත් විරිත් විශ්වාස, ඇදහිලි යන මේවායින් හැඩගස්වන ලද ඒවා විය. ඔවුනට තමන්ගේ නිම් වලලු සිඳ බිඳ බැහැරට යාමට කිසිදු අවශ්‍යතාවයක් තිබුණේ නැත.

ඇමෙරිකාවේ විසූ නමැති රතු ඉන්දියානු නායකයා වරක් මෙසේ කීය. "සතෙකු මරා ගතහොත් ඒ සතාගේ සියළු මාංශය අපි පාරිභෝජනය කරමු. පළහැටියන් අල්ලා ගැනීමට තණකොළවලට ගිනි තැබීමේ දී ඉන් බැහැර කිසි දෙයක් විනාශවීමට ඉඩ නොතබමු. අප පලවැල නෙළාගන්නේ ගස් කොලන් සෙලවීමෙනි. පලවැළ නෙළා ගැනීම සඳහා ගස් කපා හෙළීම නොකරමු." කුමන රටක වුව ද දේශීය ජන කොට්ඨාශයන් සම්බන්ධයෙන් මෙය පොදුවූ චින්තනයකි. ඔවුන්ගේ අර්ථ ක්‍රමය හා තාක්ෂණය බොහෝ ප්‍රාථමික ලක්ෂණයන්ගෙන් සමන්විතය. ඔවුන්ගේ සම්ප්‍රදායානුකූල ජීවන ක්‍රමය හා තාක්ෂණය බොහෝ ප්‍රාථමික ලක්ෂණයන්ගෙන් සමන්විතය. ඔවුන්ගේ සම්ප්‍රදායානුකූල ජීවන ක්‍රමය බොහෝ චිරස්ථායී වූවකි. ඔවුන් දඩයම් කිරීම, මසුන් මැරීම, හේන් කෙටීම වැනි කාර්‍යයන් කළේද අස්ථාවර පරිසර පද්ධතීන්හි පවා ස්වභාවයට හානියක් නොවන ආකාරයෙනි. එහෙත් ඉතා නූතනවූද, බෙහෙවින් දියුණුවූද, ඇතැම් වර්තමාන ශිල්ප ක්‍රම ඇතත්, ඒවාට පරිසර පද්ධතීන්හි සමබරතාවයට හානියක් නොවන අන්දමින් ස්වකීය පැවැත්ම තහවුරු කර ගැනීමට හෝ හැකියාවක් නොමැති බව මෙහිදී පෙනී යන කරුණකි.

දේශීය ජීවන ක්‍රමයේ සාර්ථකභාවයට මූලික සාධකයක්වී ඇත්තේ ස්වභාව පරිසර පද්ධතින් හා බැඳී පවතින ස්ථිරසාර

භාවයයි. දේශීයයන් තමන් අවට අති ගස්වැල්, පස, සතුන් හා දේශගුණික තත්ත්වයන් ප්‍රයෝජනයට ගන්නේ එම සම්පත් පිළිබඳ දැනුම උපයෝගී කරගෙන එම සම්පත් හීන නොවන ආකාරයටයි. දුම්කොළ වගාව නිසා පසුගිය දශක කිහිපය තුළ සිදු වූ තරම් හානියක් කාලාන්තරයක් තිස්සේ මෙරට කඳුකර බිම්වල පවත්වාගෙන එන ලද වගා ක්‍රමයක් වූ හේන් කෙටීමෙන් සිදුවී නොමැත. සොබා දහමට හානි නොකර එය සමඟ සහජීවනයෙන් ජීවත්වන්නේ කෙසේද යන්න අපේ මුතුන් මුත්තෝ දැන සිටියහ. හේන් කෙටීම වූ කලී ගොවියාගේ යැපීමට අවශ්‍ය සෑම දෙයක්ම පාහේ සලසා දුන් විවිධාංගිකරණය වූ ගොවිතැන් ක්‍රමයකි. හේන් කෙටීමෙන් ලබාගන්නා ලද ධාන්‍ය වර්ග, එළවළු වර්ග, පලා වර්ග ආදිය ගොවියාට සෑහෙන කලක් ජීවත්වීමට ප්‍රමාණවත් වේ. හේනෙන් පිට කැලෑ රොදෙහි ගොවියා දඩයම් කළේද තමාගේ ප්‍රධාන ආහාරයට බාහිර වශයෙන් එක්විය යුතු පෝෂ්‍ය පදාර්ථ සම්පාදනය කර ගැනීම සඳහා පමණි. හේනෙන් හා ඒ අවට කැලෑ රොදෙහි ගොවියා දඩයම් කළේද තමාගේ ප්‍රධාන ආහාරයට බාහිර වශයෙන් එක්විය යුතු පෝෂය පදාර්ථ සම්පාදනය කර ගැනීම සඳහා පමණි. හේනෙන් හා ඒ අවට කැලෑ රොදෙහි ගස්වැල්වලින් හා බවභෝගවලින් ගොවියාට අවශ්‍ය ආහාර හා බෙහෙත් ද්‍රව්‍ය, සෙවිලි හා ආවරණ අමු ද්‍රව්‍ය වැනි බහුවිධ සම්පත් රාශියක් ලැබුණු අතර සතුන් දඩයම් කිරීමෙන් මස්, හම් හා සත්ව තෙල්, රූහැන් වැනි දේ ලබාගත හැකිය.

ශ්‍රී ලාංකීය දේශීය ජන කොට්ඨාස අතර තරඟයකට වඩා පැවතියේ සමඋපකාරික ස්වරූපයකි. මෙය ද ඔවුනට ස්වභාව ධර්මය සමඟ සහජීවනයට රුකුල් දෙන්නක් විය. ලෝකයේ බොහෝ ශිෂ්ඨාචාරයන්හි සිදු වූ අන්දමට විවිධ ජන කොට්ඨාශ ඔවුනොවුන්ට මුහුණ දුන් අවස්ථාවල ආධිපත්‍යය සඳහා සටන් කිරීම සිදුවූයේ කලාතුරකිනි. ජන කොට්ඨාශ කිහිපයක් පවා එකට එක්ව ජීවත් වූ අතර හේන් ගොවිතැන් වැනි කාර්යයන්හි දී ඔවුහු එක්ව තැනින් තැන ගමන් කළහ. එසේ කරමින් මුලින් ගොවිතැන් කළ භූමිය නැවත වල්බිහි වී සාරවත් වන්නට ඉඩ දුන්හ.

ජානයන්ගේ විවිධත්වය සත්ව ශාබ විශේෂයන්හි බහුලත්වය එකම සත්ව හෝ ශාබ විශේෂයක විවිධ කොට්ඨාශයන්හි විශේෂත්වය වැනි දේ ශ්‍රී ලාංකික ගොවියා බොහෝ විට දැන සිටියේ නැත. මෑතක් වනතුරු මෙරට වී වර්ග දෙදහසක් පමණ තිබීම මීට කදිම නිදසුනකි. ජාන විවිධත්වය පිළිබඳ විවිධ මිණුම් ශ්‍රී ලාංකික ගොවියා විසින් බොහෝ විට උපයෝගී කරගන්නා ලදුයේ හීලෑ කරගන්නා ලද සත්ව විශේෂයන් මගිනි. ජාන විවිධත්වය පිළිබඳ නූතන ශිල්ප ක්‍රම වනජීවී විශේෂයන්ට ද දැන් උපයෝගී කරගනු ලැබේ.

ශ්‍රී ලංකාවේ පැවති බොහෝ ඖෂධ පැල වර්ග කුමන ආකාරයේ හෝ රෝගාබාධ සුව කිරීමට සමත්වේ. දේශීය වෛද්‍ය ක්‍රමවලට දේශීය පැලෑටි ඉතා බහුල වශයෙන් යොදා ගැනේ. තෙත් කලාපීය පහත් බිම් හා කඳුකරය ඖෂධ පැලෑටි විශේෂයන්ගෙන් බෙහෙවින් පෝෂිතය. මෙරට දේශීය වෘක්ෂලතාවලින් 90% ක් පමණම ඖෂධීය වටිනාකමක් ඇති ඒවාය. කවදත් අපේ වෙදහෙදකම්වලට යොදා ගනු ලැබුයේ අපේ රටේ පැලෑටීන්ය. මෙහි වෙනස්වීමක් සිදුවූයේ පහලොස්වන හා දහසය වන සියවස්වල පරසතුරු ආක්‍රමණවලට රට ගොදුරුවීමත් බටහිර වෛද්‍ය ක්‍රම මෙරටට හඳුන්වාදීමත් සමඟය. දේශීය ක්‍රම වඩාත් සකසුරුවම් සහිතවූ ද ප්‍රායෝගික වූ ද, හානිදායක නොවූ ද ක්‍රම බව යළි හඳුනා ගන්නේ ලද්දේ ඉතා මෑතකදීය.

ස්වභාව ධර්මයේ බහුවිධභාවය ගොවීහු තමන්ගේ අස්වනු ආරක්ෂා කරගැනීම සඳහා යොදා ගත්හ. ඔවුන් සියළුම කෘමීන් හා කුරුල්ලන් මරා දැමීමට උත්සාහ කළේ නැත.. ඒ වෙනුවට ඒ ඒ සතුන් අතර අන්‍යෝන්‍ය වශයෙන් ජෛවී පාලනයක් පැවතීමට ඉඩ සැළසූහ. කුඹුරක "කුරුළු පාළුව" යනුවෙන් වගා බිම් කොටසක් වෙන් කරන ලදුයේ කුරුල්ලන්ගේ පරිභෝජනය සඳහාය. කුරුල්ලෝ කුරුළු පාලුවේ රැඳෙමින් කෘමීන් පාලනය කරගැනීමට ගොවීන්ට උදව් කළහ. එම කුරුල්ලන් අසල කුඹුරෙහි සිටින කෘමී සතුන් අල්ලා ගැනීමෙන් ගොවියාට මෙම මෙහෙය ඉටුවේ. ගොවියා තම ගොවිපලේ වැට දිගට පළතුරු ගස් සිටවූයේ තම ප්‍රයෝජනය සඳහාම නොව කුරුල්ලන්ට ද පැමිණ එම කණු මත රැඳී සිටින්නට ඉඩ සැලැස්වීම මගින් එසේ ලැග සිටින කුරුල්ලන් ලවා ගොවියාට හානි කෙරෙන කෘමි සතුන් අල්ලා ගැනීමට ඉඩ සලසමිනි. මෙය කෘමීන් පිළිබඳ ජෛවී පාලනය සඳහා වූ සරල ක්‍රමයකි. ගව මහීෂාදී සතුන් විටින් විට වනාන්තරයට මුදා හරින ලදුයේ වනයේ සිටින ඒ ඒ වර්ගවල වන සතුන් හා මිශ්‍රවීමෙන් ඔවුන්ගේ ඊළඟ පරම්පරාව වඩාත් ශක්තිමත් භාවයට පත් කරවීමයි. මෙරට ගොවියාගේ ජීවන පැවැත්මට උපකාර වූ විවිධ ධාන්‍ය වර්ග, අල වර්ග පළතුරු වර්ග හා මී පැණි "හරිත විප්ලවය" සිදු නොවන්නට තවදුරටත් රැකෙන්නට ඉඩ තිබුණි.

සත්ව ශාක විශේෂවල විවිධත්වයේ ප්‍රතිශතය ශ්‍රී ලංකාවේ ජෛවී විවිධත්වය ආරක්ෂා වන්නට බොහෝ විට හේතු වූයේ පරිසරය පදනම් කොටගත් කෘෂිකාර්මික ක්‍රම පැවතීමත් මිහිතලය මත ජීවත්වන සියළුම ප්‍රාණීන් සතු සමාන අයිතිවාසිකම්වලට ගරු කිරීමත් නිසාය. වනාන්තරයෙන් ඖෂධ පැලෑටි එකතු කැර ගැනීම ද නැතහොත් එම පැලෑටි ගෙවතුවල වගා කරගැනීම ද මේ රටට අමුත්තක් නොවේ. බටහිර ආධිපත්‍යය පැතිරෙන්නට පෙර වන සතුන් තොග ගණනින් මරා දැමීමක් මෙරට සිදු නොවීය. ශ්‍රී ලාංකීය ජනතාව සතුන්ට පවා වෛද්‍ය පහසුකම් සලස්වන ලද ජාතියක් බවට ඉතිහාසය දෙස් දෙයි. සෑම රජෙකුම වෛද්‍යවරයෙකු විය යුතු වූයේ වෛද්‍ය ශාස්ත්‍රය ගැන දැන සිටීම රජකමට පත්වීමට අවශ්‍ය මූලික සුදුසුකමක් ලෙස සැලකූ හෙයිනි. කිසිවෙකු සතුන් මැරුවා නම් එසේ කළේ හුදෙක් තම පවුලේ හෝ ප්‍රජාවගේ ආහාර අවශ්‍යතාව සඳහා පමණි. රටේ සාමාන්‍ය ජනතාව දඩයම ක්‍රීඩාවක් වශයෙන් පිළිගනු ලැබුයේ හෝ අනුගමනය කළේ හෝ නැත. මිනිසාට

හානි කරවූ සතුන් හා සර්පයින්ගෙන් මහහැර යාම මිස ඔවුන් දුටු තැන මරා දැමීමක් සිදු නොවීය. ජනතාව පරිසරය ආරක්ෂා කළේ තමන් එම පරිසරය මත රඳා පවතින බව දැන සිටි හෙයිනි. පරිසරය පිළිබඳව දේශීය ජනතාව තුළ තිබුණු උසස්ම විඥානය නම් පරිසරය හා බැඳී තිබුණු සමීප සබැඳියාවයි.

දේශීය වෛද්‍ය ක්‍රමය ඉගැන්වීමේ දී ශිෂ්‍යයාට පැවරුණු වැදගත් පරීක්ෂණයක් වූයේ වනයට වැද සියළුම පැලෑටිවල ඖෂධීය ගුණය හඳුනා ගැනීමත්, වෙදකමට උපයෝගී කර නොගන්නා පැලෑටියක් වේතොත් ගෙනවිත් තම ගුරුවරයාට ඉදිරිපත් කිරීමත්ය. මැනවින් උගත් ශිෂ්‍යයෙකුට ඖෂධීය වටිනාකමක් නැති කිසිම පැලෑටියක් වෙන්කර දැක්වීමට නොහැකි විය. මෙය අතිශයෝක්තියෙන් යුතු ප්‍රවාදයක් ලෙස පෙනී ගියත් එම කාරණයට පදනම් වූ සත්‍යය නම් ජෛවී විවිධත්වයට හා ඒ පිළිබඳ දැනුමට එම සමාජය කොතරම් වැදගත් තැනක් දී තිබුණේද යන්න පැහැදිලි බන බවයි.

ප්‍රායෝගික බුදු දහමේ වැදගත් ලක්ෂණයක් වන්නේ භාවනාවයි. ගිහි පැවිදි දෙපාර්ශ්වයම පුරුදු පුහුණු කරන කරණීයමෙත්ත සූත්‍රය බුදුන් වහන්සේ විසින් දේශනා කරන ලද වැදගත් සූත්‍රයක් වේ. එම සූත්‍රයෙන් බහුවිධ වූ ස්වභාව ධර්මයේ සියළුම සත්වයින් වෙත කරුණාව, මෛත්‍රිය පහල කෙරේ. සියළු සත්වයෝ සුවපත් වෙත්වා! (සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා) භාවනාවෙන් අපේක්ෂා කරන ලද මානසික පාරිශුද්ධත්වය මෙයයි. මෙම සත්වයො කවරහුද? උහු විවිධාකාර ගුණාංගවලින් යුක්තවූවෝ වෙති. තැන තැන ගමන් කරන සත්වයෝය. (තසා), ගමන් නොකරන එකම තැන ස්ථාපිත වූ සත්වයෝය. (ථාවරා), දීර්ඝ වූ සත්වයෝය. (දීඝා), මහත් වූ සත්වයෝය. (මහන්තා), මධ්‍යස්ථ සත්වයෝය. (මජ්ඣිමා), කුඩා සත්වයෝය (රස්සකා), අදෘශ්‍යමාන මත්වයෝය (අනුක), තරවූ සත්වයෝය (ථූලා), ඇසට පෙනෙන සත්වයෝය (දිට්ඨා), ඇසට නොපෙනෙන සත්වයෝය. (අද්දිට්ඨා), පවත්නා සත්වයෝය (භූතා), පැවැත්ම ලබමින් සිටින සත්වයෝය (සම්භවේසී), ආදී වශයෙන් සත්වයන්ගේ ගති ලක්ෂණ අනුව එම සූත්‍රයේ ලෝක සත්වයින් හඳුනාගෙන තිබේ.. පාචිත්තිය පාලියෙහි සඳහන් වන අන්දමට බුදුන්වහන්සේ සිය ශ්‍රාවකයින්ට ළිඳකින් හෝ දොලකින් හෝ ලබාගන්නා ලද ජලය පෙරහන් කඩකින් නොපෙරා පරිභෝජනය නොකරන ලෙස අවවාද දී තිබුණි. එසේ උපදෙස් දෙන ලද්දේ එම ජලයේ ඇසට නොපෙනෙන තරම් කුඩා ප්‍රාණීන් සිටි හෙයිනි. කෙල ගැසීමෙන් හෝ මුත්‍රා කිරීමෙන් ජලය අපිරිසිදු නොකළ යුතු විය. මන්ද? මිනිසාගේ කෙල හා මූත්‍රාවල අඩංගු දෑ විෂවන්නට ඉඩ ඇති ක්ෂුද්‍ර ප්‍රාණීන් එම ජලයේ සිටිය හැකි හෙයිනි. එමතුද නොව එම ජලය පසු අවස්ථාවක දී හෝ දොළ පහළදී පරිභෝජනය කරන සත්වයෝ අපමණ වෙති. ජලය එසේ පරිභෝජනය කෙරෙන හෙයින් එය අපිරිසිදු නොකළ යුතුය. ගොවිතැනට පොළොව සකස් කිරීමේ දී කිසියම් ප්‍රමාණයකට වඩා පොළොව සෑරීම නුසුදුසු බව පිළිගනු ලැබුයේ ගැඹුරට හැරීම නිසා මතුපිට ස්ථරයේ සතුන් විනාශ විය හැකි හෙයිනි. 13 වැනි සියවසේ ශ්‍රී ලංකාවේ ලියවුණු සද්ධර්ම රත්නාවලියේ කතුවරයා ගොවිතැන් කිරීමේ රටාව කොතරම් දුරට පරිසරය හා බැඳී පවතින්නේ ද යන්න පැහැදිලි කරයි.

ජෛව විවිධත්වයේ තවත් වැදගත් අංගයක් වන්නේ මානව සංස්කෘතික විවිධත්වයයි. සංස්කෘතික විවිධත්වය නිරන්තරයෙන් සිදුවන වෙනස්වීම්වලට අනුකූලව හැඩ ගැසෙන්නට මිනිසාට අනුබල දෙයි. භාෂාව, ආගමික සිරිත් විරිත්, ඉඩම් කළමනාකරණ ක්‍රම, කලාව, සංගීතය, සමාජ ව්‍යුහය, ධාන්‍ය, ආහාර හා වෙනත් ලක්ෂණ මගින් මෙම සංස්කෘතික විවිධත්වය ප්‍රකටවේ. ආක්‍රමණිකයන් නොවූ කුමන විදේශිය ජන කොට්ඨාශයකට වුව ද ශ්‍රී ලංකාවේ ජනතාව නිතරම ආගන්තුක සත්කාර කළහ. ඔවුන් අමුත්තන් වශයෙන් පිළිගත්හ. මෙරට අතීතය ජාතිභේද වාදයේ කථාන්තරයක් නොවී බහු වාර්ගික සමාජයක් පවතින ප්‍රබුද්ධ ඉතිහාසයක් ලෙසින් පවතිනුයේ මෙම ලක්ෂණය නිසාය.



'රිටි පන්නය' සම්ප්‍රදායික ධීවර පන්න ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ දකුණු වෙරළේ අහංගම ප්‍රදේශයේ පමණක් දක්නට ලැබේ.